04/2010


මගේ අංකය / எனது இல. / My No. : රජි10/ විවිධ/ උප්/ 201/2009

ඔබේ අංකය / உமது இல. / Your No. :

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. : 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. : 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail : rgd@sltnet.lk, rg@rgd. gov.lk


චක්‍ර ලේඛ අංකය: 4/2010


තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. : 565

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

பதிவாளர் நாயகம் திணைக்களம்

REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය

தலைமை அலுவலகம்

HEAD OFFICE

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Baththaramulla'

වෙබ් අඩවිය / இணையத் தளம் / Web site : www.rgd.gov.lk


දිනය / திகதி / Date : 2010-06-24

සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් ,
සියළුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත .

## උප්පැන්න ලේඛනයේ පියාගේ ජාතිය නොහොත් ජනවර්ගය ( Race) නිවැරදි කිරීම

උප්පැන්න ලේඛනයක් ලියාපදිංචි කිරීමේදී එය ලියාපදිංචි කළ රෙජිස්ට්‍රාර්වරයා අතින් සිදුවූ අඩුපාඩුවක් / වරදක් නිසා එම උප්පැන්න ලේඛනයේ පියාගේ ජාතිය නොහොත් ජනවර්ගය (Race) වැරදි අයුරින් සඳහන්වී ඇති බව පෙනී යන්නේ නම් , එම අඩුපාඩුව / වරද උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 52 වගන්තියේ දක්වා ඇති විධිවිධාන අනුව , නිවැරදි කළ හැකි බවට නීතිපති විසින් උපදෙස් ලබාදී තිබේ .

02) එම උපදෙස් අනුව පහත සඳහන් සීමිත අවස්ථාවන්වල දී පමණක් 52(1) (එෆ්) වගන්තිය යටතේ ක්‍රියා කර උප්පැන්න ලේඛනයක පියාගේ ජාතිය නොහොත් ජනවර්ගය (Race) නිවැරදි කිරීම සඳහා මෙයින් උපදෙස් දෙමි .

(1) උප්පැන්න ලේඛනයේ දෙවෙනි පිටපතේ හෝ නොමිලයේ නිකුත් කරන පිටපතේ හෝ පියාගේ ජාතිය නොහොත් ජනවර්ගය (Race ) නිවැරදිව සඳහන්ව ඇති මුත් මුල් පිටපතෙහි පියාගේ ජාතිය වැරදි ලෙස සඳහන්වීම

(2) උපතක් ලියාපදිංචි කිරීම සඳහා විස්තර සඳහන් බී 144 ආකෘතිය , ග්‍රාම නිළධාරි උපත් වාර්තාව , උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 16 සහ 24 වගන්ති යටතේ ප්‍රකාශ පත්‍ර , 20 වගන්තිය යටතේ වතු වාර්තාව, 49 වගන්තිය යටතේ මහේස්ත්‍රාත් වාර්තාව වැනි ලියවිලි වල පියාගේ ජාතිය නොහොත් ජනවර්ගය (Race ) නිවැරදිව සඳහන්, නමුත් අදාල උප්පැන්න ලේඛනයෙහි පියාගේ ජාතිය නොහොත් ජනවර්ගය (Race) වැරදි ලෙස සඳහන්කර තිබීම.

(3) උප්පැන්න ලේඛනයක පියාගේ ජාතිය නොහොත් ජනවර්ගය (Race) සඳහන් කල යුතු තීරයේ වෙනත් තීරයක ඇතුලත් විය යුතු කරුණු ඇතුලත් කර තිබීම.

03. ඉහත දැක්වෙන අඩුපාඩු සහිත උප්පැන්න ලේඛනයක පමණක් පියාගේ ජාතිය නොහොත් ජනවර්ගය (Race) 52(1)( එච්) වගන්තිය යටතේ ලබාගත් ප්‍රකාශ පත්‍රයක් මත නිවැරදි කිරීම සඳහා නියෝගයක් ලබා දිය යුතු අතර ඉන් බාහිර සෑම අවස්ථාවකම උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 28 වගන්තියේ සඳහන් විධිවිධාන පරිදි ක්‍රියා කළ යුතුවේ .

04 මෙම කාර්ය ඉටු කිරීමේදී උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 28 වගන්තියෙහි විධිවිධාන හා නොගැටෙන පරිදි පහත උපදෙස් අනුව ක්‍රියා කරන ලෙස කාරුණිකව දන්වමි .

(1) 52(1) වගන්තිය යටතේ වූ ප්‍රකාශ පත්‍ර මත අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙල මේ සඳහා අනුගමනය කළ යුතු අතර , 52 (1) වගන්තිය යටතේ ප්‍රකාශ පත්‍රයක් මත ක්‍රියා කිරීමේදී සබ දැනට ලබා ගන්නා ලියවිලි වලට අමතරව , පියාගේ ජාතිය නොහොත් ජනවර්ගය (Race) , නිවැරදි කළයුතු උප්පැන්න ලේඛනය හිමිකරුගේ පියාගේ උප්පැන්න සහතිකය මෙම කාර්යය සඳහා අනිවාර්යයෙන්ම ලබා ගත යුතුවේ .

(2) පියාගේ ජාතිය නොහොත් ජනවර්ගය (Race) සංශෝධන කිරීමට අපේක්ෂිත උප්පැන්න ලේඛනයේ පියාගේ සම්පූර්ණ නම 27(ඇ) වගන්තිය යටතේ සංශෝධනය නොවී තිබිය යුතුය.

(3) පියාගේ උප්පැන්න ලේඛනයෙහි සඳහන් පියාගේ ජාතිය නොහොත් ජනවර්ගය (Race) ඒ අයුරින්ම යොදා, නිවැරදි කළ යුතු උප්පැන්න ලේඛනයේ පියාගේ ජාතිය නොහොත් ජනවර්ගය (Race) නිවැරදි කළ යුතුය.

රෙජිස්ට්‍රාර් ජනරාල් .

ඩී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් 1) ලේකම් , රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - ඔබගේ දැන ගැනීම සඳහා

2) නීතිපති - යොමුව ර/ 412/2009 හා 2010-04-27 අනුව දැන ගැනීම සඳහා

3) සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් /අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් වරුන් - ඔබගේ දැන ගැනීම සඳහා

4) සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - ඔබගේ දැන ගැනීම සඳහා

5) ප්‍රධාන කාර්යාලයේ සහ මධ්‍යම ලේඛනාගාරයේ සියළුම මාණ්ඩලික නිළධාරීන් - ඔබගේ දැනගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා